ද මැසිනොද් විදුහල, කඳාන

ඉතිහාසය (25 S-I) කාලය පැය 3

26.03.2018

මෙම කොටස පශ්න 40 කින් සමන්විත වේ. සියලුම ප්‍රශ්න වලට මෙම ප්‍රශ්න පත්‍රයේම පිළිතුරු සපයන්න.

## I කොටස

- අංක 1 සිට 10 තෙක් එක් එක් ප්‍රශ්නය සඳහා නම් පහ බැගින් දී ඇත. ඒවා අතුරෙන් එකක් පමණක් කවරහෝ හේතුවක් නිසා අනෙක් නම් සමග නොගැළපේ. එම නොගැළපෙන නාමය තෝරා එහි අංකය වරහන තුළ ලියන්න.

Learning Resource Centre
R
De Mazenod College
Kandana

(1) 1.මහාතිත්ථ 2. මාන්තායි 3. මාන්තෝට්ටම්
4. මාහාගාම 5. මාපුටු (..........)

(2) 1. පණ්ඩු 2. මහාරත්ථක 3. රාජ රාජ
4. රාජේන්ද්‍ර 5. පුලහත්ථ (..........)

(3) 1. අම්බතිත්ථ 2. ගිම්හතිත්ථ 3. මහාතිත්ථ
4. නීලවාලතිත්ථ 5. ජම්බුකෝලපට්ටන (..........)

(4) 1. බදුලු ටැම් ලිපිය 2. හැබැස්ස ලිපිය 3. තිරුවලංගාඩු ලිපිය
4. වල්ලිපුරම් සන්නස 5. තිඹිරිවැව ලිපිය (..........)

(5) 1. පොම්පරිප්පු 2. දැදිගම 3. පාහියන්ගල
4. මිනිහාගල්කන්ද 5 රංචාමඩම (..........)

(6) 1. පැරිස් 2. ලන්ඩන් 3. ඇම්ස්ටර්ඩෑම්
4. ලිවර්පූල් 5. ලිස්බන් (..........)

(7) 1. හෙරඩෝටස් 2. සොක්‍රටීස් 3. පෙට්‍රාක්
4. ප්ලේටෝ 5. ඇරිස්ටෝටල් (..........)

(8) 1. රුසියාව 2. ඔස්ට්‍රියාව 3. චෙකොස්ලෝවැකියාව
4. පර්සියාව 5. යුගෝස්ලෝවියාව (..........)

(9) 1. මයිකල්ආන්ජලෝ 2. පැරසෙල්ස් 3. රෆායල්
4. බොට්ටිචෙලී 5. ලියනාඩෝ ඩාවින්චි (..........)

(10) 1. රොමියුලස් 2. ඔගස්ටස් සීසර් 3. තියඩෝෂස්
4. කොන්ස්ටන්ටයින් 5. ජස්ටිනියන් (..........)

නොගැළපෙන යුගලය තෝරා එහි අංකය සඳහන් කරන්න

(11) 1. පණ්ඩුකාභය-චිත්‍රා 2. දුටුගැමුණු -විහාරමහා දේවිය
3. පළවන විජයබාහු-ලෝකිතා 4. වසභ-පොත්ථා දේවී
5. හය වන පරාක්‍රමබාහු-සුනේත්‍රා දේවී (..........)

(12) 1. වෙවැල්කැටිය ලිපිය-ගම් සමූහයක යුක්තිය පසිදලීම
2. මිහින්තලා පුවරු ලිපි-භික්ෂූන් සඳහා නීති
3. බදුලු ටැම් ලිපිය-වෙළඳපොළක කළමණාකරණය
4. ගොඩවාය ලිපිය-භික්ෂූන්ට කරනලද ලෙන් පූජාවක් පිළිබඳව
5. පනාකඩුව සන්නස-බුද්ධල්නා සෙන්පති හට කරන ලද ගෞරවය පිළිබඳව (..........)

(13) 1. බසවක්කුලම- වසභ
2. තිසා වැව- දේවානම්පියතිස්ස
3. කන්තලේ වැව- දෙවන අග්ගබෝධි
4. නාච්චදුව වැව- දෙවන මුගලන්
5. හුරුළු වැව- මහසෙන් (..........)

(14) 1. පළවන සේන - ශ්‍රී මාර ශ්‍රී වල්ලභ
2. හතරවන මිහිදු - තුන් වන ක්‍රිෂ්ණ
3. පස් වන මිහිදු - පළවන රාජ රාජ
4. පළවන විජයබාහු- සත් ද්‍රවිඩ
5. අසේල- එළාර (..........)

(15) 1. අභයවාපී- බසවක්කුලම
2. මණිහිරවාපී- මින්නේරිය
3. පත්තපාෂාණවාපී- නාච්චදුව
4. ගංගාතටවාපී- කන්තලේ
5. පාණ්ඩවාපී- පරාක්‍රමසමුද්‍රය (..........)

X හා Y තීරු නිවැරදිව ගැළපා ඇති පිළිතුර තෝරා වරහන තුළ සටහන් කරන්න

(16)

| X | Y |
|---|---|
| සියුස් | A නගර ආරක්ෂාවට හා ප්‍රඥාවට අධිපති දෙවඟන |
| ඇපලෝ | B මුහුදට අධිපති දෙවියා |
| ඇෆ්‍රඩයිට් | C සූර්යය දෙවියා |
| ඇතිනා | D ආකාශයට අධිපති දෙවියා |
| පොසයිඩන් | E ආලයට අධිපති දෙවඟන |

DCEAB CEABD DEACB BEACD EDACB (..........)

(17)

| X | Y |
|---|---|
| රොමියුලස් | A පොදු නීති ක්‍රමයක් සකස් කළේය |
| ඔගස්ටස් සීසර් | B රෝම නගරය ගොඩනැංවීය |
| කොන්ස්ටන්ටයින් | C ක්‍රිස්තියානි ආගම රාජ්‍ය ආගම බවට පත් කළේ. |
| තියඩෝෂස් | D රෝම අධිරාජ්‍යයේ ප්‍රථම ක්‍රිස්තියානි අධිරාජ්‍යයා බවට පත්විය |
| ජස්ටිනියන් | E රෝ නගරය අලංකාර කරවීය |

DEACB CEABD BEDCA EABDC ABCDE (..........)

(18)

| X | Y |
|---|---|
| හෝමර් | A රිපබ්ලික් |
| ප්ලේටෝ | B ඉලියඩ් |
| මැකියාවෙලි | C ඩිවිනා කොමිඩියා |
| බොකෑෂියෝ | D කුමාරයා |
| ඩාන්ටේ | E ඩිකැමරෝන් |

CAEBD DEACB ABCDE EDCBA BADEC (..........)

(19)

| X | Y |
|---|---|
| පාතිනොන් | A ලන්ඩන් |
| කොලෝසියම | B පැරිස් |
| ශාන්ත පීතර බැසිලිකා | C රෝමය |
| බිග් බෙන් ඔරලෝසුව | D ඇතැන්ස් |
| අයිෆල් කුළුණ | E වතිකානුව |

DCEAB CEABD DEACB BEACD EDACB (..........)

(20)

| X | Y |
|---|---|
| රුසියාව | A මැඩ්‍රිඩ් |
| ස්වීඩනය | B මොස්කව් |
| ස්පාඤ්ඤය | C බර්ලින් |
| ජර්මනිය | D රෝමය |
| ඉතාලිය | E ස්ටොක්හෝම් |

DCEAB CEABD DEACB BEACD EDACB (..........)

සපයා ඇති උපදෙස් සම්පිණ්ඩනය ඇසුරින් නිවැරදි පිළිතුර තෝරා වරහන තුළ සටහන් කරන්න

| 1 | 2 | 3 | 4 | 5 |
|---|---|---|---|---|
| A හා B පමණක් නිවැරදිය | B හා C පමණක් නිවැරදිය | C හා D පමණක් නිවැරදිය | A හා C පමණක් නිවැරදිය | ප්‍රතිචාර එකක් හෝ දෙකකට වැඩි සංඛ්‍යාවක් නිවැරදිය |

(21) දුටුගැමුණු රජුගේ සෙනෙවියන් පිළිබඳව ලියවුණු සෙල්ලිපි ලෙස සැළකෙන්නේ
A පල්ලෙබැද්දද සංඛපාල ලිපිය
B චේවැල්කැටිය ලිපිය
C දෙකුම්දරවැව ලිපිය
D සොරබොරවැව ලිපිය (..........)

(22) ලංකා ඉතිහාසය ගොඩනැගීමට ආධාර වන ඉන්දියානු සාහිත්‍ය මූලාශ්‍ර ලෙස සැළකෙන්නේ
A ස්කන්ධපුරාණය B ජිනකාලමාලි
C සාසනවංශය D මණිමේකලා (..........)

(23) අනුරාධපුර රාජධානි සමයේ සිදුවූ ආගමික සිදුවීම් ලෙස සැළකිය හැක්කේ
A ශ්‍රී මහා බෝධිය වැඩමවීම
B ත්‍රිපිටකය ග්‍රන්ථාරූඪ කිරීම
C බුරුමයෙන් භික්ෂූන්වහන්සේලා ගෙන්වා උපසම්පදාව පිහිටුවීම
D දළදාව මෙරටට රැගෙන ඒම (..........)

(24) අනුරාධපුර යුගයේ ආර්ථිකය පිළිබඳව ලියවුණු සෙල්ලිපි ලෙස සැළකෙන්නේ
A අඹගමුව ලිපිය B සොරබොරවැව ලිපිය
C තෝනිගල ලිපිය D වල්ලිපුරම් සන්නස

(25) කාවන්තිස්ස රජු රුහුණු රාජ්‍යය ශක්තිමත් කිරීම සඳහා අනුගමනය කළ ක්‍රියාමාර්ගයන් නොවන්නේ
A විවාහ සම්බන්ධතා B ආක්‍රමණය කිරීම
C විදේශ වෙළඳාම දියුණු කිරීම D වරපුරුෂ සේවය (..........)

(26) ධාතුසේන රජු විසින් කරන ලද සේවාවන් ඇතුළත් වන්නේ
A අනුරාධපුර නගරය වටා පවුරක් ඉදි කිරීම
B ලම්භකර්ණ පෙළපත බලයට පත් කිරීම
C ග්‍රාම සීමා නියම කිරීම
D පංච ද්‍රවිඩ ආක්‍රමණයෙන් රට බේරා ගැනීම (..........)

(27) පළමුවන විජයබාහු රජුගේ කාර්යය සංසිද්ධීන් පිළිබඳ කවර ප්‍රකාශ නිවැරදිවේද?
A ශ්‍රී ලංකාව සොළී පාලනයෙන් මුදා ගත්තේය.
B පොළොන්නරු රාජධානියේ පළමු පාලකයා විය.
C පොළොන්නරු නගරය යළි ගොඩනැංවීම සඳහා ඉමහත් වෙහෙසක් ගත්තේය.
D පල්ලව රාජ්‍යය සමග යුද්ධයකට සහභාගී විය. (..........)

(28) ග්‍රීක චින්තනය පිළිබඳව කවර ප්‍රකාශ නිවැරදි වේද ?
A ප්ලේටෝ පරමාදර්ශී රාජ්‍යයක් පිළිබඳව සිය දර්ශනය ඉදිරිපත් කළේය.
B හර්කියුලීස් ගණිතක්‍රම සම්බන්ධ අදහස් ඉදිරිපත් කළේය.
C සොක්‍රටීස් පෞර රාජ්‍යය වල සංචාරය කරමින් ප්‍රශ්නෝත්තර ක්‍රම මගින් සිය අදහස් ඉදිරිපත් කළේය. (..........)

D ප්ලිනි ස්වභාවික ඉතිහාසය පිළිබඳ විශ්වකෝෂය සම්පාදනය කළේය.

(29) වැඩවසම් යුගයේ ආර්ථිකය පිළිබඳ නිවැරදි තොරතුරු ඇතුළත් වන්නේ
A ප්‍රධාන කෘෂිකාර්මික ඒකකය ප්‍රවේණිය විය
B භාණ්ඩ හුවමාරු ක්‍රමය පැවතුණි
C රජු බලවත්වූ අතර සියලු නඩු විසඳීම් රජු විසින් සිදු කරන ලදී
D මුදල් භාවිතය විරල විය (..........)

(30) පුනරුද යුගයේ සංස්කෘතික ලක්ෂණ ඇතුළත් වන්නේ
A ලෞකික රසාස්වාදය සඳහා නිර්මාණ බිහිවිය
B අධ්‍යාපනය ආගමික මුහුණුවරක් ගත්තේය
C ගොතික් ගෘහ නිර්මාණ කලා සම්ප්‍රදාව අවසන් විය
D කලා කටයුතු ශ්‍රේණි ක්‍රමය අනුව සිදු විය (..........)

අංක 31 සිට 35 දක්වා ප්‍රශ්න සඳහා ප්‍රකාශ යුගල දෙක බැගින් දී ඇත. එක් එක් ප්‍රශ්නය සම්බන්ධයෙන් දී ඇති ප්‍රකාශ යුගලයට වඩාත්ම ගැළපෙන ප්‍රකාශ යුගළය වගුව තුළින් තෝරා ඊට අදාල අංකය වරහන තුළ ලියන්න.

| | පළමුවැනි ප්‍රකාශය | දෙවැනි ප්‍රකාශය |
|---|---|---|
| 1 | නිවැරදිය | වැරදිය |
| 2 | නිවැරදිය | නිවැරදිය |
| 3 | වැරදිය | වැරදිය |
| 4 | වැරදිය | නිවැරදිය |
| 5 | නිවැරදිය | නිවැරදි වන අතර පළමුවැන්න මැනවින් පහදා දෙයි |

| | | | |
|---|---|---|---|
| 31 | ක්‍රි. පූ. තුන්වන ශතවර්ශයේ අග භාගයේදී සේන ගුත්තික නම් ආක්‍රමණිකයන් විසින් අනුරාධපුර රාජ්‍යය පාලනය කරන ලදී | සොළී දේශයේ සිට පැමිණි එළාර නම්වූ දමිළ කුමාරයෙකු විසින් සේන ගුත්තික පරාජය කොට අනුරාධපුරය අල්ලා ගන්නා ලදී | |
| 32 | දීපවංසය ශ්‍රී ලංකා ඉතිහාස සම්ප්‍රදායෙන් දැනට ඉතිරිව ඇති පුරාණතම වාර්තාවයි. | මහාවංසයේ දෙවන කොටස චූලවංසය නමින් හැදින්වේ. | |
| 33 | මහාතිත්ථ වරායෙන් මෙරටට ගොඩබසින ලද ආක්‍රමණිකයෝ බොහෝවිට අනුරාධපුරයට ලගාවූයේ කදම්බ නදිය ඇසුරු කොටගෙනය | අනුරාධ ඇමති අනුරාධ ගාමය ඉදිකලේ කදම්බ නදී තීරයේය. | |
| 34 | සත් ද්‍රවිඩ ආක්‍රමණිකයන් අතරින් දෙදෙනෙක් සෝමා දේවිය හා පාත්‍රාධාතුව රැගෙන ආපසු ඉන්දියාවට ගියහ. | වළගම්බා රාජය සමයේ සත් ද්‍රවිඩ ආක්‍රමණය ඇතිවිය | |
| 35 | පින්ඩාර් හා සැපෝ සුප්‍රසිද්ධ ගී කාව්‍ය රචකයෝ වූහ. | හෝමර් විසින් ඉලියඩ් හා ඔඩිසි රචනා කරන ලදී | |

නිවැරදි පිළිතුර තෝරන්න.

(36) පුනරුද සමයේ කලාවට අනුග්‍රහ දැක්වූ පාප්වරයෙකු වූයේ
1. දහ වන ලියෝ 2 දෙවන නිකලස් 3. පළවන පාවුලු
4. දෙවන ඇලෙක්සැන්ඩර් 5. තුන්වන ඉන්සෙන්ට් (..........)

(37) පියෙටා නම්වූ සුප්‍රකට මූර්ති නිර්මාණය කරන ලද්දේ
1. රෆායල් 2. මයිකල්ආන්ජලෝ 3. ඩොනටෙලෝ
4. මැසැක්සියෝ 5. ඩාවින්චි (..........)

(38) ග්‍රීක ජනයා සමුද්‍රයට අධිපති දෙවියා ලෙස සැලකුවේ
1. ඩයනීසස් 2. ඇතිනා 3. සියුස්
4. පොසයිඩන් 5. මාර්ස් (..........)

(39) නැගෙණහිර රෝම අධිරාජ්‍යයේ අගනුවර ලෙස සළකන ලද නගරය කුමක්ද?
1. ඇතැන්ස් 2. රෝමය 3. කොනෝසස්
4. ඇලෙක්සැන්ඩ්‍රියාව 5. බයිසැන්තියම (..........)

(40) පුනරුදයේ ලක්ෂණයක් නොවන්නේ මින් කුමක්ද?
1. මානුෂවාදය පැතිරීම
2. රජවරු බලවත් වීම
3. දේශගවේශන සඳහා යොමුවීම
4. ස්වයංපෝෂිත ආර්ථිකයක් ඇතිවීම
5. ලෞකික රසාස්වාදයට වැඩි තැනක් ලැබීම (..........)

ද මැසිනොද් විද්‍යාලය, කඳාන

12 ශ්‍රේණිය
ඉතිහාසය
26.03.2018

12 වන ශ්‍රේණිය | ඉතිහාසය II

පළමු ප්‍රශ්නයටත් i හා ii කොටස් වලින් එක් ප්‍රශ්නයක් වත් ඇතුළත් වන සේ තවත් ප්‍රශ්න තුනකටත් පිළිතුරු ලියන්න

I පහත සඳහන් මාතෘකා අතරින් 3 පිළිබඳව කෙටි සටහන් ලියන්න

i මහසෙන් රාජ්‍ය සමය දක්වා ඉතිහාසය හැදෑරීමේදී වංසකතා හා පුරාවිද්‍යාත්මක මූලාශ්‍ර වල වැදගත්කම

ii. ක්‍රි පූ. තුන්වන සියවස දක්වා කාලය තුළ මෙරටට පැමිණි මුල් ආර්ය සංක්‍රමණික කණ්ඩායම්

iii.මානවම්ම රජුගේ පාලන සමයේ වැදගත්කම

iv. ප්‍රවේණි ක්‍රමය

v. මානුෂවාදය

Learning Resource Centre
R
De Mazenod College
Kandana

I කොටස

(2) I. පණ්ඩුකාභය රජුගේ දේශපාලන වැදගත්කම විස්තරාත්මකව පැහැදිලි කරන්න.

( ලකුණු 6)

II. පණ්ඩුකාභය රජු තමාට මුහුණ දීමට සිදුවූ අභියෝග ජයගත් ආකාරය පැහැදිලි කරන්න.

( ලකුණු 8)

(3) පහත දැක්වෙන මාතෘකා ඇසුරින් දේවානම් පියතිස්ස රාජ්‍ය සමයේ ආගමික හා සංස්කෘතික වැදගත්කම සාකච්ඡා කරන්න

ඉන්දියාව සමග පැවති සම්බන්ධතා

බුද්ධදහම පිහිටුවීම

සංස්කෘතික අභිවර්ධනය

(4)I. වළගම්බා රජුගේ පියා නම් කරන්න ? ( ලකුණු 1)

II. වළගම්බා රජුට මුහුණදීමට සිදුවූ අභියෝග විස්තර කරන්න ( ලකුණු 5)

III. වළගම්බා රජතුමාගේ යුගයේ සංස්කෘතික වැදගත්කම විස්තර කරන්න ( ලකුණු 8)

(5) මහාවංසයේ පළමු කොටසේ වීරයා දුටු ගැමුණු රජතුමාය. දුටු ගැමුණු රජුගේ ජයග්‍රහණ උදෙසා කාවන්තිස්ස රජුගේදුරදර්ශී භාවය ඉවහල්වූ අයුරු ගෙනහැර දක්වන්න

( ලකුණු 14)

II කොටස

(6) ග්‍රීක ශිෂ්ටාචාරයේ පැවති පහත දැක්වෙන අංශ වලින් දෙකක් පිළිබඳ විස්තර කරන්න

i පෞර රාජ්‍ය ක්‍රමය

II ග්‍රීක දර්ශනය

III අධ්‍යාපනය හා සාහිත්‍යය (ලකුණු 7x2)

(7) පුනරුද යුගයේ සාහිත්‍යය කලාව , චිත්‍ර හා ගෘහ නිර්මාණ ශිල්පය පිළිබඳව අගයන්න ( ලකුණු 14)

(8) i. මධ්‍යතන යුරෝපයේ පැවති වැඩවසම් ක්‍රමයේ මූලික ලක්ෂණ මොනවාද?

ii. වැඩවසම් ක්‍රමය පරිහාණියට පත් වීමත් සමග ඇතිව නව සමාජ ක්‍රමයේ මූලික ලක්ෂන පැහැදිලි කරන්න

(ලකුණු 7 බැගින්)

26.03.2018
12 ශ්‍රේණිය
ඉතිහාසය

'අ' කොටස ( ලංකා කලා ඉතිහාසය )

එක් කොටසකින් එක් ප්‍රශ්නයක් තෝරාගෙන ප්‍රශ්න තුනකට පිළිතුරු සපයන්න.

01) 18 වැනි සියවස කන්ද උඩරටින් ඇරඹි චිත්‍ර කලා සම්ප්‍රදාය එම ප්‍රදේශයටය පමණක් සීමා නොවී පහතරට ප්‍රදේශවලටද පැතිර ගියේය.
1. මෙම යුගයේ උඩරට චිත්‍ර කලාවෙන් පහත රට චිත්‍ර කලාව වෙනස් වූයේ කෙසේදැයි දක්වන්න.
2. පහතරට චිත්‍ර කෙරෙහි යුරෝපීය බලපෑම් කවරාකාරදැයි කතළුව, තෙල්වත්ත, කරගම්පිටිය යන විහාර සිතුවම් ඇසුරින් පහදන්න.

02) කොළඹ යුගයේ විහාර කලාවට උරුදුන් ශිල්පීන් අතර එම් සාර්ලිස් හා සෝලියස් මැන්දිස් විශේෂ තැනක් හිමිකර ගනී,
1. එම් සාර්ලිස් තෙලි තුඩින් නිමවූ කොළඹ නගරයේ විහාරස්ථාන දෙකක් නම් කරන්න.
2. එම් සාර්ලිස් ගේ සහ සොලියස් මැන්දිස්ගේ සිතුවම් හෙළියන්හි කැපී පෙනන ලක්ෂණ පිළිබඳ තුලනාත්මක විග්‍රහයක යෙදෙන්න.

'ආ' කොටස

සංස්කෘතික පසුබිම හා රසාස්වාදය, ඉන්දියාව

03) මොහෙන්ජෝදාරෝ හා හරප්පා ශිෂ්ඨාචාරයට අයත් නගර වැසියන් උසස් කලා කෞශල්‍යයෙන් යුක්ත ජන කොටසක් බව කැණීම්වලදී හමුවූ ද්‍රව්‍ය හා මෙවලම් වලින් පැහැදිලි වේ.
1. මෙම කැණීම්වලින් හමුවූ ද්‍රව්‍ය හා මෙවලම් හතරක් සඳහන් කරන්න.
2. ඉන්දු නිම්න කැණීම්වලින් හමුවූ පාෂාණ භාවිතයෙන් කළ මූර්ති තුනක් නම් කරන්න.
3. එම මූර්ති ඇසුරෙන් ඔවුන් තුළ වූ සෞන්දර්යාත්මක කුසලතාව පහදන්න.

04) පහත සඳහන් මාතෘකා අතරින් 2ක් පිළිබඳව කෙටි සටහන් ලියන්න.
1. පශුපති මුද්‍රාව
2. සාංචි ස්තූපය
3. අජන්තා ලෙන්
4. නළඟන රුව

Learning Resource Center
R
De Mazenod College
Kandana

'ඉ' කොටස
සංස්කෘතික පසුබිම හා රසාස්වාදය ( යුරෝපය )

05) මිසරය වූ කලී ලොව ඉසුරුමත් බවින් පිරිපුන් මායාහුරු කලා නිර්මාණයන්ගෙන් යුතු ඉතා දියුණුව පැවති ශිෂ්ඨාචාරයකි
1. නයිල් මිටියාවතේ විසූ පාරාවරුන්ගේ අභිමානවත් ප්‍රෞඪත්වය සුවිසල් පිරමීඩ තුළින් ලොවට කියා පෑ අයුරු පහදන්න.
2. මිසර කලා නිර්මාණ අතර සුවිශේෂ නිර්මාණයක් වූ කුරළු දඩයම නැමති චිත්‍රය පිළිබඳව ඇගයීමක් කරන්න.

06) ජීවිතයේ අනේකවිධ දුක්ඛ දෝමනස්සයන් මැදින් ජීවිතයට උරදුන් වින්සන්ට් වැන්ගෝ තම ආත්මීය අපේක්ෂාවන් හා ආකල්පයන් ලොවට චිත්‍රය කර පෙන්වීමට සමත්වූ ප්‍රතිභාපූර්ණ ශිල්පියෙකි.
1. වින්සන්ට් වැන්ගේ තම චිත්‍ර තලය මත වර්ණය හා තෙලිතුඩ හැසිරවූ අයුරු ඔබ දකින්නේ කෙසේද ?
2. ඔහු මානව හිතවාදී සානුකම්පිත දෘෂ්ටිය චිත්‍රනය කළ අයුරු සිරගෙදර ආලින්දය, නැතහොත් රාත්‍රි අවන්හල චිත්‍රය ඇසුරෙන් විමසන්න.